01. පහත දී ඇති ඡේද ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ඇති බවත් නො දැන සෙසු ස්ත්‍රීන් හා සමඟ සිත් අලවා කෙළිමින් සෙමින් අභිරමණය කොට ඇවිදිනාහ. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලැජ්ජාවෙන් හා සපත්නීරෝෂයෙන් දුර්වල ව පඬුවන් සිරුරු ඇති ව ඉපිල හුණු නහරබහනින් වලඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ. ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති ඒ බිසව් එක් දවසෙක්හි රජගෙන් දන් අනුභව කරන්ට ආ මයිල් රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්නී ය. එකල්හි තාපසයෝ ද ඉතා ම දුර්වල වූ ශරීරයක් ඇති, මිරිකුණා වූ චක්ෂුරාදි ඉඳුරන් ඇති බිසවුන් දැක දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියත්: 'රාජ කුමාරිකාව, මේ බරණැස් නුවර රැදාවල් ඇත් සන්නාහයෙන් සරහන ලද ඇත් පිට සත් සියයක් පමණ යුද්ධ ක්‍රීඩාවෙහි දක්ෂ වූ යෝධයෝ පඤ්චායුධ සන්නද්ධ ව රැකවල් ගෙන සිටිනාහ. අවිරාධවේධී වූ සොළොස් දහසක් පමණ ධනුර්ධර යෝ එසේ ම රැකවල් ගෙන සිටිනාහ. මෙසේ සුරක්ෂිත ව තව ද අපමණ වූ අස් සෙනඟ ද පාබළ සෙනඟ ද එපරිද්දෙන් සන්නද්ධ ව රැකවල් ගෙන සිටිනාහ. මෙසේ සුරක්ෂිත ව රැකවල් ගෙන සිටිනා ලද මෙනුවර කෙසේ වූ සතුරු කෙනෙක් දන්නෙහි ද? කයට සිතට ඇම වේලේ භය උපදවන බද්ධ මෘගයන් ඇති වනයෙහි වාසය කොට ආ අවධියෙහි තොපගේ රූපශ්‍රීය ද ශරීර ශෝභාව ද ඉතා ම යහපත.

i. බිසව ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති වීමට හේතු කවරේ ද?
ii. නගරයේ ආරක්ෂාව කෙබඳු වී ද?
iii. පංචායුධ යනු කවරේ ද?
iv. **අවිරාධවේදී, ධනුර්ධරයෝ, සන්නාහයෙන්** යන පදවල අර්ථ ලියන්න.

(ආ) සතරමහමුහුද පැන් විතරටත් බොහෝ ව' යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සෙ ශෝකදුඃඛය තුනී විය. ශෝකදුඃඛය තුනී නියාව දැනලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නො හෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු ය' යි වදාරා විසි වන මග්ගවග කෙළවර ගාථා දෙකින් බණ වදාළසේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාරදෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොව් සැපතට ලොවුතුරා සැපතුත් යම්තම් විතරක් ලත්හ.

i. නුවණැත්තවුන් කළ යුත්තේ කුමක් ද ?
ii. ගෙවූ කෙලෙසුන් කෙසේ වී ද?
iii. යම්තම් විතරට ලත් ලොව්තුරා සැපත කුමක් ද ?
iv. **නටුවා වූ ලොව් සැපත, ආර්ය ජාතිය** යන පදවල අර්ථ දක්වන්න.

(ඇ) වඤ්චා දන්නා මනුෂ්‍යයෝ එක තෙන ඉඳ එක් ව කා බී එක් ව වැදහෙව එක් ව කථා කොට හිඳත් තමන්ගේ චෞර ස්වභාවය නො හරනාහු ම ය. එබැවින් වඤ්චා සිත් ඇති අසත්පුරුෂ සොරුන් අහසට පොළොව සේ දුරින් ම දුරු කට යුත්තේ ය. වඤ්චා දන්නා සොරහු සිතින් එකක් සිතති; කටින් එකක් කියති; කයින් අනිකක් කෙරෙති. ඉදින් යම්තම් අවසරයක් ලද්දාහු වී නම් තමන්ට උපකාර කළවුන්ගේ බාල්‍ය අවස්ථායෙහි පටන් උපයා රැස් කළ වස්තුව සියල්ල ම ඇරගෙන පලා යන්නාහු ම ය. එබැවින් සොරුන් කෙරෙහි විශ්වාසයෙක් නැත් ම ය. සෙස්සන් තබා වැදූ මව්පියන් හා බන්ධුජනයෝ ද බාල අවස්ථායෙහි පටන් එක කෙළිමඬලෙහි කෙළ ඇවිදි මිත්‍රජනයෝ ද පවා සොර සිත් ඇති අසත්පුරුෂයන් දුර එන්නා දුටත් අනර්ථයක්, අවැඩක් කෙරේ දෝ හෝ යි යන භයින් සැකයෙන් දුරින් ම දුරු වන්නාහු ම ය' යි මෙසේ සොරුන්ගේ නුගුණු ප්‍රකාශ කොට කියා 'ස්වාමීනි, මෙබඳු අනුන් සන්තක වස්තු සොරා පැහැරගන්නා වූ මිත්‍රද්‍රෝහියා ළඟ රඳවාගෙන තවා පළා නාවා තෙල් ගල්වා ඇඟ ඉස ගාපියන තෙල් සුගත් නසා කුමක් පිණිස දුක් ගන්නා සේක් ද, ඇසිල්ලකුත් මෙතන නො රඳවා ලුහුබඳවාපුව මැනව' යි කී ය.

i. උපකාර කළවුන්ට සොරු කුමක් කෙරෙත් ද?
ii. මව්පියන්, නෑයන්, මිත්‍රයන් සොරුන්ට කුමක් කෙරේ ද?
iii. තෙලට කුමක් වන බව පැවසේ ද?
iv. මෙසේ පවසනුයේ කිනම් පුද්ගලයෙකු ගැන කවර තෙර නමකට ද?

02. පහත දී ඇති පද්‍ය ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) අප නිරිඳු යසසා
නො කියා ඔවුන් සහසා
පවසන බස් අසා
පවර නුවණැති දනෝ වෙසෙසා

දිනමිණි කුල'ග පත්
නිරිඳෝ ම වෙත් යහපත්
එයින්'ප රජු පවත්
මෙසේ අසව්'යි කියා පවසත්

තෙදින් රිවිබිම්බා
නිරිඳු සඳ පැරකුම්බා
රුපු සිඳු කලම්බා
කෙළෙ ය විරු සිරි සඳ කුලම්බා

i. වෙනත් දේශවලින් පැමිණි ජනයා පැවසුවේ කවුරුන් ගැන ද?
ii. ශ්‍රේෂ්ඨ වන බවට කවියා පවසන්නේ කුමන රජවරුන් ගැන ද?
iii. තෙවැනි පද්‍යයේ රජුගේ වීරත්වය දැක්වීමට කවියා ඇසුරු කොට ඇති පුරාණෝක්තිය කුමක් ද?
iv. **කුල'ගපත්, පවර, රිවිබිම්බා, සිරිසඳ** යන පදවල අර්ථ දක්වන්න.

(ආ) වනසර දැක තම සිත බිය සලසා
ගන ගැබ ලෙළ දෙන විදුලිය විලසා
වනගැබ ඔබිනොබ පැන යන නො ලසා
තැන තැන මුව රළ දැක යව සතොසා

වනවිල් වැද බොල් සෙවෙලැග තවරා
ගන වල් කැල ඇරගෙන අතිනුදුරා
දිගු උල් සිඟු යොමු කර කර අඹරා
පිළිමල් වන මීවුන් දකු නුදුරා

i. මුවන්, වනයේ පැන යන ස්වරූපය කවියා දැක ඇත්තේ කෙසේ ද?
ii. කුළුහරකුන්ගේ රෞද්‍ර විලාසය කවියා පවසන්නේ කෙසේ ද?
iii. **වනසර, ගන ගැබ, සිඟු, පිළිමල්** යන පදවල අර්ථ දක්වන්න.
iv. **ඔබිනොබ, සෙවෙලැග, අතිනුදුරා** යන පද විසන්ධි කොට ඒවාහි සන්ධි නාමය ද ලියා දක්වන්න.

03. පහත සඳහන් උද්ධෘතයන් සඳහා **අවස්ථා සම්බන්ධය** ලියන්න.

i. 'පින්වත් අශෝකමාලා දේවී තමා තෙපි ද?'
ii. 'යම් කෙනෙක් රූ අරූ පස්කඳින් අවිද්‍යාප්‍රත්‍යයෙන් රූ උපද්දී, තෘෂ්ණාප්‍රත්‍යයෙන් රූ උපද්දී...'
iii. 'නුඹ වහන්සේට ප්‍රත්‍යයදායක ඇත්රජ තෙම විෂ පෙවූ හීයකින් විදිනා ලද්දේ කාලක්‍රියා කෙළේ ය.'
iv. 'ආචාරිනි, බාල දරුවන් කීයේ කාරණා ය.'

04. මෙම ප්‍රශ්නයෙහි සියලු ම අනුකොටස්වල **නිවැරදි වරණය** තෝරන්න.

1. ***උක්ත පදයක් ඇතුළත් ව නො මැති වරණය*** තෝරන්න.

i. මිනිසෙක්, ගවයෙකු, මිනිසුන්, කාන්තාවක්
ii. ගැහැනියක්, ලිපිකරුවෙකු, කවියෙකු, රිළව්
iii. කාන්තාවක, අප, තා, මිනිසෙකු
iv. අයෙක්, කෙනෙක්, දෙනෙක්, ඇතැමෙක්
v. මිනිසෙකු, කෙනෙකු, අයෙක්, සමහරෙක්

2. **ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන පදයක්** සහිත වරණය තෝරන්න.

i. සාහිත්‍යය, සෞන්දර්ය, භෞතික, නෛතික
ii. කෙරුම්, නැටුම්, රැගිලි, කෙඳිරිලි
iii. සුදන, දුදන, නිරෝගි, සත්පුරුෂ
iv. යානවාහන, ඇඳුම් පැළඳුම්, උඩයට, ඔප්පුතිරප්පු
v. ම, ද, මෙන්, වැනි

3. පද සතරෙහි ම **අක්ෂර වින්‍යාසය** නිවැරදි වරණය තෝරන්න.

i. පාචනය, ශ්‍රවණය, කථනය, නිදානය
ii. ප්‍රාන්තය, ග්‍රන්තය, කවන්දය, සුගන්ධය
iii. බැලිණි, කැපුනු, වැටිණි, පෙණිනි
iv. සතර, වර්ණ, පුතනු, මරණය
v. මරනවා, පිළිම, කෙළෙස්, වෙළඹ

4. **අනම්‍ය ස්වර පමණක්** ඇතුළත් වරණය තෝරන්න.

i. අ, උ, ඔ
ii. ඇ, ඉ, එ
iii. ඇ, එ, ඔ
iv. අ, උ, ඉ
v. ඔ, උ, ඉ

5. **ව්‍යාකරණානුකූල** වාක්‍යය සහිත වරණය තෝරන්න.

i. ඇතැම්හු එඑමස් කෑමට ප්‍රිය කරයි.
ii. ඒ ප්‍රදේශයේ සොරබිය ඇතැයි ප්‍රචාරයක් පවති.
iii. රන්මාලය පැළඳගත් ඇය කැඩපත ඉදිරියේ සිට හැඩවැඩ බලන්නේ
iv. මී මැස්සෝ වනමල් සොයා යනු ඇත.
v. ශිෂ්‍යයා ගුරුඋපදේශ අනුව ම ක්‍රියා කරත් ද?

6. **විභක්ති සමාසයට** අයත් නො වන පදය ඇතුළත් වරණය තෝරන්න.

i. ගත්කරු
ii. බඹදත්
iii. රන්කම්
iv. රතුරෙද්ද
v. බෙහෙත්

7. **අකාරාදි පිළිවෙළ** වැරදියට යොදා ඇති වරණය තෝරන්න.

i. කසුන්, කමල්, කාන්චන, කුසල්, කෝසල.
ii. ගයාන්, ගිහාන්, රොහාන්, සහන්, සිතුම්.
iii. අසංක, ඉසංක, නිශාන්ත, මධුසංක, මිහිරංග.
iv. උදිත, නදිත, සමිත, සුමිත්, හිරාන්.
v. අංජන, කීර්ති, වින්දන, විසල්

8. මුලින් දක්වා ඇති අදහසට **සාම්‍යාර්ථයක් සහිත පදය** ඇතුළත් වරණය තෝරන්න.

**කුහක ගති ඇති තැනැත්තා**

i. වාචාලයා
ii. අමනයා
iii. නරුමයා
iv. වසවර්තියා
v. කේඩෑරියා

9 **විරුද්ධාර්ථයේ යුගළ පදයන්** ඇතුළත් වරණය තෝරන්න.

i. දුරබැහැර
ii. අංගඋපාංග
iii. ඇත්ත නැත්ත
iv. සිරිත්විරිත්
v. අපලඋපද්‍රව

10. **උක්ඛේපණය හෙවත් උක්ෂේපණය** යනු
   i. යම් කිසිවක් බැහැර කිරීම යි.
   ii. යම් කිසිවක් ඇතුළු කිරීම යි.
   iii. යමක් හෙළිදරව් කිරීම යි.
   iv. යම් කිසිවක සිදුවන වෙනස යි.
   v. ඉතා කෙටි කලකින් සිදුවන වෙනස යි.

11. **සීමාර්ථයේ නිපාතයන් නො මැති** වරණය තෝරන්න.
   i. තෙක්
   ii. සිට
   iii. පටන්
   iv. තුරු
   v. නැවත

12. **සර්ව නාමයන් යෙදී නැති** වරණය සහිත පිළිතුරු තෝරන්න.
   i. සෝමා ද අනුලා ද මම ද ගායනා තරගයට ඉදිරිපත් වූයෙමු.
   ii. ප්‍රශ්න සියල්ලට ම නිමලා පිළිතුරු ලීවා ය.
   iii. ඔවුන් ශ්‍රමදානයට සහභාගි වෙති'යි තාත්තා කීවේ ය.
   iv. රාත්‍රියේ රසකැවිලි සාදා අම්මා උදැසනින් ම ඒවා අපට දුන්නා ය.
   v. තෝ මිහිරි ලෙස ගායනා කරහි.

13. **යනු ලැබුවා ය.** යන ක්‍රියාව,
   i. උත්තම පුරුෂ බහුවචන කර්මකාරක ක්‍රියාවකි.
   ii. උත්තම පුරුෂ ඒකවචන කර්මකාරක ස්ත්‍රී ලිංග ක්‍රියාවකි.
   iii. ප්‍රථම පුරුෂ ඒකවචන ස්ත්‍රීලිංග කර්මකාරක ක්‍රියාවකි.
   iv. ප්‍රථම පුරුෂ ඒකවචන ස්ත්‍රීලිංග කර්තෘකාරක ක්‍රියාවකි.
   v. ප්‍රථම පුරුෂ බහුවචන කර්මකාරක ස්ත්‍රීලිංග ක්‍රියාවකි.

14. **තද්ධිත පද පමණක් ඇතුළත්** වරණය තෝරන්න.
   i. සෞන්දර්ය, කාර්යය, දෛනික, නීතිය
   ii. ගැමියා, තොටියා, කොටියා, නැවියා
   iii. සෛද්ධාන්තික, භෞතික, වෛදික, වරලස
   iv. සිඟමන්, නැටිලි, රැඟුම්, විදිලි
   v. කරටි, දිගටි, කැබලි, වකුටු

15. **සන්ධි පදයන් ඇතුළත් නො මැති** වරණය තෝරන්න.
   i. ලිග්ගල, ලග්ගල, අග්ගල, වත්තල
   ii. අත්සන, පෙත්සම, විස්කම්, පන්නම්
   iii. රුක්කත්තන, පොත්තල්මාරිය, ගොක්කත්ත, කොන්සැට
   iv. නිලඹර, මලසුන, සුරඟන, වරඟන
   v. එකිනෙක, ඔබිනොබ, උනුන්, නිරනිඳු

16. **සංස්කෘත භාෂාවෙන් සිංහලට පැමිණි උපසර්ග** පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   i. ප, පර, අව, ස
   ii. නි, දු, වි, උ
   iii. අභි, අධි, ප්‍ර, ප්‍රති
   iv. පන්, පිළි, අති, අ
   v. අනු, උප, අප, අව